ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව -2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වටිනාකම රු. 45,847,500 ක් වූ ප්‍රවාහන උපකරණ තුළ ඇතුළත් නොවූ ට්‍රැක්ටර් 11 ක හා බවුසර් 02 ක ලියාපදිංචි අයිතිය 2024 දෙසැම්බර් 31 දින වන විටද සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව පැවති අතර මෙම වාහන වෙනත් ආයතනයක් වෙත ලබාදී තිබේද, අපහරණය කර හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද යන්න පිළිබඳ කිසිදු තොරතුරක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.	දෙපාර්තමේන්තුවට අයත් වාහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව පවතීද යන්න පරීක්ෂා කර වාර්තා කරන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සිටින සියළුම සමාජ සේවා නිලධාරීන් වෙත දන්වන ලදි. ලැබෙන පිළිතුරු අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව.	දෙපාර්තමේන්තුවට අයත් වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම හා අදාළ පරිදි අපහරණය කළ යුතුය.
(ii)	වෘත්තීය පුහුණු ආයතන 5ක්, ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 2 ක් නිවර්තන හා පුනරුත්ථාපන නිවාස 2 ක් පිහිටි ඉඩම් හෙක්ටයාර 73.376 ක් හා හෙක්ටයාර 10.3804 වූ ඉඩම් කොටස් 5 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරා ගෙන ගිණුම් ගත කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමේ හා තක්සේරු කිරීමේ ක්‍රියාවලි අවසන්වූ පසුව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ඉඩම් හා ගොඩනැගිලි පවරා ගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේදයට යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශ	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු අක්කර 29ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 06 ක් පරිත්‍යාග කර වර්ෂ 11 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද, එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	1.6.1.(අ) (ii)
1.6.1 (ආ)	වෘත්තීය පුහුණු ආයතන 07 ක ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබූ අතර ඉකුත් වර්ෂ 11 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	1.6.1.(අ) (ii)
2.3	රජයේ වාහනයක් ඉගෙනුම් ආධාරයක් වශයෙන් පරිහරණය කරන්නේ නම් නිසි ක්‍රමවේදයක් අනුව වාහනය අපහරණය කොට ලියාපදිංචිය මෝටර් රථ ආඥා පනත ප්‍රකාරව අවලංගු කිරීමෙන් පසු යොදාගත යුතු වුවත් වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයට ලබා දී තිබු වාහන 5 හි වැසි අංක ද සහිතව ඉගෙනුම් ආධාරක වශයෙන් යොදා ගෙන තිබුණි. තවද වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ තිබෙන යතුරු පැදි 19 ක් කැටවල වෘත්තීය පුහුණු ආයතනය වෙත රැගෙන ගොස් තිබූ නමුත් යතුරු පැදිවල අංක තහඩු සහිතව එම ආයතනයේ රඳවා ගෙන තිබුණි.	1.6.1.(අ) (i)
3.1.5	2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කොට 2022 දෙසැම්බර් 20 දින විවෘත කරන ලද කිලිනොච්චි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් රු. 1,280,000 ක් වැය කර තිබුණු අතර ඉඩමෙහි වටිනාකම රු. 93,630,000 ක් බව නිරීක්ෂණය විය. 2023 වර්ෂයේ මැයි මාසයේදී පාඨමාලා දෙකක් සඳහා අභ්‍යාසලාභීන් බඳවාගෙන පාඨමාලා ආරම්භ කර තිබුණද 2024 ජනවාරි වන විට උපදේශකවරුන් නොමැතිකම නිසා පාඨමාලා පැවැත්වීම නවතා තිබුණි. සියළු පහසුකම් සහිතව විශාල මුදලක් වැය කර ඉදිකරන ලද මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මේ වන විට මධ්‍යස්ථාන භාර නිලධාරි, සංවර්ධන නිලධාරි යන නිලධාරි පමණක් අනුයුක්තව නිශ්කාර්යව සිටින අතර ආරක්ෂක අංශයට සහ පවිත්‍රතා අංශය වෙනුවෙන් ද ගෙවීම් කරමින් පවතී. ඒ අනුව මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	4.2.(අ)(ii)
3.2 (ඇ)	2023 වර්ෂයේ වෘත්තීය පුහුණු පාඨමාලාව සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 11 වෙත බඳවා ගැනීම් සලකා බැලීමේදී මධ්‍යස්ථාන 6 ක් තුල නේවාසික පහසුකම් හා පුහුණුව ලැබීමට ඇති පහසුකම් 450 දෙනෙකු සඳහා පැවතුනද සමාලෝචිත වර්ෂයේදී 288 දෙනෙකු පමණක් පුහුණුවීම් ලබා ගෙන තිබීම නිසා එම මධ්‍යස්ථාන 06 ඌන උපයෝජිත වී තිබුණි.	4.2.(අ) (i)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මාණ්ඩලික නිලධාරි හා කාර්යය මණ්ඩල රැසවීම්වලදී අභ්‍යන්තර පාලන ක්‍රම හා එහි ඵලදායිතාවය පිළිබඳව සාකච්ඡා කරන අතර ඊට අදාල අවශ්‍ය නිවැරදි කිරීම සිදු කරනු ලබයි. අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව ගනණ්දීමේ නිලධාරි විසින් සහතික වීමක් 2025 අප්‍රේල් 11 දින ලිපියක් මගින් ජාතික විගණන කාර්යාලය වෙත භාර දී ඇති බව.	ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර පාලන පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 5.2 ඡේදය	667,920	2019 ජනවාරි 21 දින සිට 2024 ජනවාරි 20 දක්වා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා සිටින නිලධාරිනියක සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා	විදේශ නිවාඩු අවසන්ව සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2024 ජුනි 05 දින සේවය අතහැරයාමේ නිවේදනය සහ ගිවිසුම ප්‍රකාරව අදාල මුදල	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ

			නැවත සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව ගණනය කරන ලද දණ්ඩන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ගෙවන ලෙස දන්වා විදේශ ලිපිනයට යවන ලද ලිපිය නැවත අප වෙත ලැබී ඇත. පළමු සිහිකැඳවීම් ලිපියක් 2024 ඔක්තෝබර් 18 දින ඇයගේ මෙරට ලිපිනය වෙත යොමු කර ඇත. නිලධාරිනියගේ විදෙස් ලිපිනය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙත 2025 මැයි 15 දිනැතිව ලිපියක් යොමු කර ඇති බව.	යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01 /2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2)	95,000 .91,200	තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීමේදී සමාජ සේවා නිලධාරීන්ට ලබා ගත හැකි උපරිම අතුරු අග්‍රිම මුදල රු.80,000 ක් වුවද ඊට අනුකූල නොවන ලෙස දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන් දෙදෙනෙකු විසින් එම සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගෙන තිබුණි.	රිදියගම ආයතනය සඳහා මුළුතැන් ගෙයි උපකරණ වල අවශ්‍යතාවය දැඩිව පවතින බව ස්ථානභාර නිලධාරි විසින් දිගින් දිගටම දන්වා සිටි හෙයින් අතුරු අග්‍රිමයක් ලබා දී ඇත. විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කරමින් කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කළ බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය	144,900	තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි උපරිම සීමාව ඉක්මවා කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනයේ ස්ථාන භාර නිලධාරී විසින් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගෙන තිබුණ ද මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය සඳහා ලබා දී ඇති අතුරු අග්‍රිම සීමාව අතපසු වීමකින් ඉක්මවා ලබා දී ඇති බව.	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඈ)	මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ 31(5) ඡේද	2,094,063	තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා නිලධාරියා විසින් එම කාර්යය නිමවූ විගසම පියවීම් කළ යුතු වුවද වෘත්තීය පුහුණු ආයතනවල හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් විසින් වර්ෂය තුළ අවස්ථා 65 ක දී ලබා ගෙන තිබූ අත්තිකාරම් දින 16 සිට දින 336 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී පියවීම් සිදුකර තිබුණි.	අත්තිකාරම් ලබාගෙන පියවීමට ප්‍රමාද වූ අවස්ථා සැලකිල්ලට ගෙන එවැනි අවස්ථා ඇති නොවන ආකාරයෙන් ඉදිරියේදී කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ)	2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (i) (අ) සහ 04 ඡේද		පොදු දේපළ අස්ථානගත වීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන්ම රජයේ මුදල් ඵලදායි ලෙස යොදාගැනීම තහවුරු කිරිම සඳහා, රජයේ සියළුම වාහන නිසිපිරිදි උපයෝජනය කිරිම, ලේඛනගතකර පවත්වා ගැනීම හා වාර්තා කිරීම, සියළුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ගේ අනිවාර්ය කාර්යයක් වේ.	දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත ධාවන තත්වයේ නොමැති වාහන අපහරණය කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් අවස්ථා හතරකදී රුපියල් 109,660ක් තත්කාර්ය අතුරු අග්‍රිම මුදල අවශ්‍ය වන කාලසීමාවට මසකට පමණ පෙර අතුරු අග්‍රිම ලබාගෙන තිබුණු අතර ඉන් සියයට 50 කට වැඩි මුදල් ප්‍රමාණයක් අත ඉතිරි වී තිබුණි.එම ඉතිරි මුදල් සැලකිය යුතු කාලසීමාවක් අත රඳවාගෙන පියවා තිබුණි. එසේම තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන් කලින් ලබාගත් අග්‍රිම	ITMIS පද්ධතිය හරහා අක් මුදල් ඉල්ලුම් කර සති දෙකක් පමණ අක් මුදල් ලැබීමට ගතවන බැවින් සති දෙකකට පෙර වවුචර් ඉදිරිපත් කරන ලෙද අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව.	තත්කාර්ය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් අදාල වන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කිරීම සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.

පියවීමට පෙර නැවත අග්‍රිම ලබාගෙන තිබුණි.මේ අනුව තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගැනීම හා පියවීම සැලකිය යුතු කාල සීමාවක් ප්‍රමාද වීමෙන් මුදල් අත රඳවා ගැනීම මූල්‍ය අක්‍රමිකතාවන් සිදුවීමේ අවදානමක් පැවතියද දෙපාර්තමේන්තු කළමනාකරණයේ ඒ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු.මිලියන 11 ක් ප්‍රතිපාදන ලබාදී තිබු පුනරුත්තාපන සැලසුම් සම්බන්ධව ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රගති පිළිබඳ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය තුළ රු. මි. 6.10 ක් එනම් සියයට 55 ක ප්‍රතිපාදන රැස්වීම් සඳහා සහ ස්වඅභිමානි වැඩසටහන් සඳහා වෙන්කර තිබුණ ද ආබාධ සහිත තැනැත්තන් සවිබල ගැන්වීමේ විශේෂ ව්‍යාපෘති 30ක් ක්‍රියාත්මක කිරිමට හා ආබාධ සහිත පුද්ගලයින් 70 ක් සඳහා ආධාරක උපකරණ සැපයිමට සැලසුම් කර තිබුණද විශේෂ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කිරීම හා පුද්ගලයින් 60 ක් සඳහා ආධාරක උපකරණ සැපයීම සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට හඳුනාගෙන ඇති ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව 174,369 ක් වූ අතර ඉන් පුද්ගලයින් 157,628 දෙනෙකුගේ තොරතුරු පමණක් ගුගල් ෂීට් (google sheet) හි ඇතුළත් කර තිබුණි. ඔවුන් සඳහා පුනරුත්ථාපන සැලසුම් 16163 ක් පමණක් සකස් කර තිබුණි.	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආබාධ සහිත පුද්ගලයින් 174,719 ක් හඳුනාගෙන ඇති අතර , එම පුද්ගලයින් වෙනුවෙන් සමාජ සේවා නිලධාරීන් විසින් පුනරුත්තාපන සැලසුම් සකස් කළ යුතුව ඇත. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් එක් මාසයකට පුද්ගලයින් දෙදෙනෙකු වෙනුවෙන් සැලසුම් සකස්කළ යුතු වන අතර , එම තොරතුරු Google sheet එකට ඇතුලත් කළ යුතුවේ. මෙසේ ආබාධිත පුද්ගලයින් වෙනුවෙන් සකස් කරනු ලබන සැලසුම් හරහා එම පුද්ගලයින් වෙනුවෙන් විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 3.0 ක ප්‍රතිපාදන වෙන්කල අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉදිරිපත් වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු අනුව ප්‍රතිපාදන ලබාදීමට හැකිවූයේ ව්‍යාපෘති 22 ක් සඳහා පමණි. ආධාර ලබාදීමේ වැඩසටහනට වෙන්කරන ලද රු. මිලියන 1.4 ක මුදලින්ද, ලද ඉල්ලීම් හා ඇස්තමේන්තු අනුව ආධාර ලබාදීමට හැකිවූයේ පුද්ගලයින් 60 කට පමණක් බව.	වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය කර අදාල කාර්යයන් ඉටු කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආබාධිත ළමුන් වෙනුවෙන් දිවයින පුරා වෘත්තීය පුහුණු ආයතන 11 ක් පවත්වාගෙන යනු ලබන අතර එම ආයතන වල ළමුන් සඳහා නේවාසික පාඨමාලා 51 ක් පවත්වාගෙන යනු ලැබේ.පාඨමාලා පැවැත්වීම සඳහා වෘත්තීය පුහුණු උපදේශකවරුන් 53 කුත් අනෙකුත් කාර්ය මණ්ඩලය 161 ක් ද එම වෘත්තීය පුහුණු ආයතන වල සේවයේ නියුක්තව සිටී.		
(i)	2023 හා 2024 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතන වල ළමුන් බඳවා ගැනීමේ ධාරිතාව හා ධාරිතාවය උපයෝජනය සැසඳීමේදී වෘත්තීය පුහුණු ආයතන 07 ක ධාරිතා උපයෝජනය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් වෘත්තීය පුහුණු ආයතනවලට බඳවාගනු ලබන්නේ දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 16-35 අතර ආබාධ සහිත තරුණ තරුණියන්ය. මේ පිරිස අතුරින් වැඩි පිරිසක් මන්ද මානසික ප්‍රජාවයි. මෙම පිරිස සමාජ ගත කිරීම දැඩි අභියෝගයකි. විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් පාඨමාලා සඳහා ධාරිතාවයන් ඉක්මවන සේ බඳවා ගැනීම් සිදු කරනු ලබයි. නමුත් බඳවා ගන්නා අවස්ථාවටද සහභාගී නොවී යම් පිරිසක් වෘත්තීය පුහුණුව හැරයාම පාලනය කළ නොහැකි බව.	වෘත්තීය පුහුණු ආයතන පවත්වාගෙන යාමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ii)	2023 සහ 2024 වර්ෂ වල එක් එක් වෘත්තිය පුහුණු ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අනුව එක් ශිෂ්‍යයකු වෙනුවෙන් එක් ආයතනයක් රු.335,142 සිට රු.1,075,738ක පරාසයක වියදමක් දරා තිබුණද වෘත්තීය පුහුණු ආයතන ආරම්භ කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි. කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනයේ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2023 වර්ෂයේ 15ක් හා	ඒ ඒ අභ්‍යාසලාභියාට පෞද්ගලික වන සේ ඔවුන්ගේ කුසලතා හා නිපුණතා හඳුනාගෙන තනිපුද්ගල සැලසුම් සකස් කර ස්වයං රැකියා සඳහා යොමු කළ හැකි අභ්‍යාසලාභීන් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුගත වෙමින් වෘත්තීය පුහුණු කටයුතු සිදුකරයි. ඒ අනුව අභ්‍යාසලාභීන් වෘත්තීය පුහුණුව තුළින් බලගන්වා මනා පෞරුෂයකින් යුත් ආර්ථික	ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට සම්පත් උපයෝජනය කර ගත යුතුයි.

	2024 වර්ෂයේ 33ක් වුවද කිසිවෙක් පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි.	ප්‍රවාහයේ සක්‍රිය කොටස්කරුවෙකුවීමේ අවස්ථාව ලබාදීම ඇතුළු ක්‍රියාකාරකම් ඉටු කරන බව.	
(iii)	2023 හා 2024 වර්ෂයේ බඳවා ගත් සිසුන් සංඛ්‍යාවෙන් පාඨමාලා සම්පූර්ණ කළ සංඛ්‍යාව හා රැකියා ගත කළ සංඛ්‍යාව සලකා බැලීමේ දී 2023 හා 2024 වර්ෂවල පාඨමාලා සම්පූර්ණ කළ සංඛ්‍යාවෙන් රැකියා ගත කළ සංඛ්‍යාව පිළිවෙලින් සියයට 38 ක් හා සියයට 23 ක් විය.	මෙම වසරේ සිට ESPD ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක වන සිහින ශ්‍රී ලංකා වැඩසටහන මගින් අබාධ සහිත පුද්ගලයන් රැකියාවේ රඳවා තබා ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එමගින් මෙම තත්ත්වය මගහරවා ගත හැකි වනු ඇති බව.	වෘත්තීය පුහුණු පාඨමාලා හඳුන්වා දීමේ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කල යුතුයි.
(ආ)	සංශෝධිත වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව පාඨමාලා සාර්ථකව අවසන් කළ වෘත්තීය පුහුණුලාභීන් 150 දෙනෙකුට මෙවලම් කට්ටල සැපයීම සඳහා රු.මි. 5 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ප්‍රගතිය පිළිබඳ වාර්තාව අනුව රු.මි.3.3 ක් වැය කර පුහුණුලාභීන් 82 කට පමණක් මෙවලම් කට්ටල ලබා දී තිබුණි.මීට අමතරව ආසියානු සංවර්ධන බැංකු වැඩසටහන යටතේ 2022 වර්ෂයේ වෘත්තීය පුහුණු අවසන් කළ අභ්‍යාසලාභීන් දෙදෙනෙකුට රු.25,000 ක් හා රු.26,000ක් වටිනා මෙවලම් කට්ටල ලබා දී තිබුණි.	2022 - 2023 වසරවලට අදාලව මෙවලම් කට්ටල ලබා දීමට 2025 වසරේ දී අභ්‍යාසලාභීන් 11 දෙනෙක් වෙත ප්‍රතිපාදන යවා ඇත. දෙපාර්තමේන්තුව මගින් අභ්‍යාසලාභීන් 50 දෙනෙක් සඳහා මහන මැෂින් හා පරිගණක ලබා දීමට හා ADB ව්‍යාපෘතිය යටතේ අභ්‍යාසලාභීන් 45 දෙනෙක් සඳහා මෙවලම් කට්ටල ලබා දීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු.මිලියන 3.3 ක් පමණක් වියදම් දරන ලද බව.	වර්ෂයට අදාලව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වෘත්තීය පුහුණු ආයතනවල පවත්වාගෙන යනු ලබන පාඨමාලා කළමනාකරණය පිළිබඳ පරීක්ෂාවේදී උපදේශකවරු සිටියද අදාල ආයතන වල පාඨමාලා නොපැවැත්වීම, පාඨමාලා පැවතියද එම ස්ථාන වල උපදේශකවරු නොසිටීම ආදී ගැටළු පවතින අතර වෘත්තීය පුහුණු ආයතන ආරම්භ කර පවත්වාගෙන ගියද වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ නිසි කළමනාකරණය අධීක්ෂණය හා	ආයතන වෙබ් අඩවිය මේ වන විට යාවත්කාලීන කර ඇති බව හා ඉදිරියේදී අධීක්ෂණය හා පසුවිපරම මීට වඩා විධිමත්ව සිදුකිරීමට කටයුතු කරනු ලබන බව.	වෙබ් අඩවිය යාවත්කාලීන කළ යුතු අතර වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ උපදේශකවරු නිසි පරිදි කළමනාකරණය සිදු කර පාඨමාලා අධීක්ෂණය හා පවත්වාගෙන යාමටත් පසු විපරම් කිරීමත් සිදුකළ යුතුය.

පසු විපරමක් දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. එමෙන්ම ආබාධිත තැනැත්තන් සමාජගත කර ඔවුන් ආර්ථික වශයෙන් ආදායම් උත්පාදනයට ප්‍රවේශය සැලසීමේ අරමුණින් වෘත්තීය පුහුණු ආයතන ආරම්භ කර පවත්වාගෙන ගියද වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය යාවත්කාලීන කර නොතිබුණි.		

4.3 අනාර්ථික ගනුදෙනු

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් 1992-2012 වර්ෂය දක්වා මත්ලෝලින් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ලෙස වොක්ෂෝල් වීදියේ නවෝදා ආයතනය පවත්වා ගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා වරිපනම් බදු ගෙවිමක් ද සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ගොඩනැගිල්ලෙන් ඉවත් වී තිබුණද ගොඩනැගිල්ලෙන් ඉවත් වීම නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා හිඟ වරිපනම් බදු වශයෙන් රු.2,789,684 ක් කොළඹ මහනගර සභා නාගරික භාණ්ඩාගාරය වෙත ගෙවීමට දෙපාර්තමේන්තුවට සිදු වී ඇත. තවද, මෙම ඉඩම හා ගොඩනැඟිල්ලෙන් පදිංචිය හැරයාමේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු ආයතනයකට භාර නොදීම හේතුවෙන් වසර 12 ක ට වැඩි කාලයක් ඉහත ගොඩනැඟිල්ල නිශ්කාර්යව පැවතුණි.	මෙම ඉඩම රජය සතු ඉඩමක් ලෙස දැන්වීමක් යොදන ලෙසට කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත 2024 දෙසැම්බර් 18 දිනැතිව ලිපියක් යොමු කරන ලදී. වරිපනම් බදු ගෙවීම සම්බන්ධව කොළඹ මහ නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික වෙත විමසා සාකච්ඡා කිරිමට නියමිත බව.	හිඟ වරිපනම් බදු සම්බන්ධව කළමණාකරණය නිවැරදි තීරණයකට එළඹිය යුතුය. .

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිරසර සංවර්ධන අරමුණු යටතේ හඳුනාගෙන තිබූ පළමු සංවර්ධන අරමුණු වන 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීම තහවුරු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන්ට ස්වදේශිකයන්ට සහ අවධානමට ලක් වියහැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම වුවත් දෙපාර්තමේන්තුව සතුව දිවයින පුරා විසිරි සිටින ආබාධ සහිත පුද්ගලයින්, අවධානමට ලක්විය හැකි ළමුන් වැනි මෙම අරමුණට අදාල පාර්ශවයන්ගේ සංඛ්‍යාවන් හා තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් වාර්ෂිකව ජයග්‍රහණ දර්ශකය තුලින් 2030 වන විට එම අරමුණ සාක්ෂාත් කර ගැනිමට ඇති හැකියාව අවම මට්ටමක පැවතුණි.	වෘත්තිය පුහුණු ආයතනවලින් රැකියාගත කල පුද්ගලයන් පිලිබඳව දත්ත පද්ධතියක් සමාලෝචිත වර්ෂයේදී නිර්මාණය කර නොතිබුනද මේ වන විට සියළු ආයතනවල තොරතුරු ඒකරාශී කර දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර ඇති බව.	2030 වන විට ඉලක්කගත අරමුණ සාක්ෂාත් කරගත හැකි වන පරිදි අදාළ කටයුතු සිදු කළ යුතුයි.
(ආ)	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම තිරසර සංවර්ධන අරමුණු යටතේ හඳුනාගෙන තිබූ දෙවන සංවර්ධන අරමුණ වුවද සමාලෝචිත වර්ෂය තුලදී එම අවස්ථා ලබා දී තිබූ සංඛ්‍යාව හඳුනාගෙන නොතිබුණි. දිවයිනම ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද ආබාධිත පුද්ගලයින්ගේ සහ යෞවනයන්ගේ දත්ත පද්ධතිය නොමැති වීමෙන් 2030 වන විට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් ඉලක්කයක් ජයග්‍රහණය කලේද යන්න තහවුරුවක් නොතිබුණි.	දිස්ත්‍රික් 25 හි ප්‍රදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් විසින් හඳුනාගත් ආබාධ සහිත පුද්ගලයන්ට පුනරුත්ථාපන සැලසුම් සකස් කර ඒ අනුව අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසුව රැකියාගත කිරීමට ක්‍රියා කරන ලද බව. සමාජ සේවා නිලධාරීන් වෙත රැකියා ගත කිරීම සඳහා වාර්ෂිකව ඉලක්ක ලබා දි කාර්තුවකට වරක් ප්‍රගතිය විමසමින් පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන බැවින් ඉදිරියේදී ඉලක්ක සාක්ෂාත් කිරීම පිලිබඳව තහවුරු කර ගැනීමට හැකිවනු ඇති බව.	දිවයිනම ආවරණය වන පරිදි වාර්ෂිකව අපේක්ෂිත ඉලක්ක දැක්විය යුතු අතර එම ඉලක්ක සපුරාගැනීම පිළිබඳව දත්ත පද්ධතිය පවත්වාගත යුතුයි.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු ප්‍රමාණය 375 ක් විය. ඉන් තනතුරු 28ක පුරප්පාඩු 232 ක් වසර 01 ත් 10 ත් අතර කාලයක සිට පවතින අතර සංවර්ධන නිලධාරී සේවය I/II/III සංවර්ධන නිලධාරි (සමාජ සේවා) තනතුරෙහි අතිරික්තතා 68 ක් පැවති අතර එම සේවයේ එම ශ්‍රේණියෙහිම සංවර්ධන නිලධාරී (වැඩිහිටි/සමාජ සේවා) තනතුරෙහි පුරප්පාඩු 23ක් පැවතුණි.	අංක SSD/02/07/08/01(II) හා 2025 පෙබරවාරි 14 දිනැතිව, එම අවස්ථාව වන විට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ තනතුරු වල පැවති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇති බව.	කාලයක සිට පවතින පුරප්පාඩු අවම කර අතිරික්තතා මඟින් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය.